සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 47 S I,II |
|---|---|---|
| නම: ............................................ | සිංහල සාහිත්‍ය රසාස්වාදය - I | කාලය පැය තුනයි |

## I - පත්‍රය

- මෙම කොටසට පිළිතුරු සපයා වෙනම භාරදෙන්න.

(01) i සිට v තෙක් කොටස් කියවා ඒවා ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

I. "මුඹ දූන් ගිය මැනව. මම රඳමි"
(අ) මේ ප්‍රකාශය කළේ කවරෙක්ද? ..............................................................................................
(ආ) ප්‍රකාශය කළේ කා හටද? ..............................................................................................

ii. "හා...... හා....... ඕක පැත්තකින් තියපං. ඒක විතරයි උඹට මාමාගෙන් තවම ඉගනගන්න බැරිඋනේ"
(අ) මෙහි කියවෙන ඉගෙන ගන්න බැරිඋන දේ කුමක්ද? ..............................................................................
(ආ) මෙම කොටස අයත් ග්‍රන්ථයේ නම ලියන්න. ..............................................................................

iii. "යාළුවා දූන් වෙලාව කීයට ඇද්ද"
(අ) මෙසේ ප්‍රකාශ කළේ කවුද? ..............................................................................
(ආ) පිළිතුරු දුන් තැනැත්තා අනතුරුව කුමක් කළේද? ..............................................................................

iv. "කුමක් නිසා තෝ මෙතැනට ආයෙහි දූයි"
(අ) මෙසේ පැවසුවේ කවුද? ..............................................................................
(ආ) මෙහි සඳහන් තෝ යනු කවුද? ..............................................................................

v. "පැයකදී එකට හමුවන දුර ඈත දෙතැන - මෙය වෙන්කරනු හැකි කිසිවකු වෙද කොතැන"
(අ) මෙම පද්‍ය කොටස අයත් පද්‍ය නිර්මාණය සඳහන් කරන්න. ..............................................................................
(ආ) එය රචනා කළේ කවුද? ..............................................................................

(ලකුණු 4×5 20)

(02) පහත දූක්වෙන ගද්‍ය - පද්‍ය කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සපයන්න.

"ස්වාමීනි" මුඹ වහන්සේ දෙව්ලොව වැඩි ගමනේ දෙවඟනන් පන්සියයක් මා ලබන නියාවට වූ ඇපයෙක් ඇත්තේ වේද මෙවක් පටන් දෙවඟනන් තබා කිසිවකත් මාගේ ඇල්මක් නැති හෙයින් ඒ ඇප නැතැයි කී සේක. බුදුහු ඒ අසා වදාරා නන්දයෙනි, තොප රහත් වූ නියාව අපිත් දතුම්හ. දේවතාවකුත් අවුත් අපට කීව. එසේ හෙයින්, තොප කීවාත් නොකීවාත් අපි ඒ ඇපයෙන් මිදුණාම්හ' යි වදාරා රහත්ව ශෝභාවත්වූ මුහුණ ඊටම තබා ශෝභාමත් කරවූ සේක. වහන්දෑ ගොසින් රහත් නියාව නොදූන ''කුමක්ද පෙර සිතන්නේ සිවුරු හරනට වේද? දෑන් කුමක්දූයි'' විචාරා ''මා ගිහිවිටෙහි ආලයෙන් නැතැ''යි කී කල්හි මූ ගිහි විටෙහි ආලයක් නැති නියාව කියති. මුන් බොරු කියන නියා වේදූයි බුදුන්ට එපවත් දූන් වූ සේක.

බුදුහු ඒ අසා මහණෙනි යම් සේ සෙවිලි නොදක්මෙන් නපුරු කොට සොයා ලූ ගෙයි වැසි නැති විටෙක මුත් වැස්ස වට විටම තෙමේද එ පරිද්දෙන් සමථ භාවනා, විදර්ශනා භාවනා නැමැති සෙවිල්ල නො දන්නා හෙයින් තදංග විමුක්ති නැමති එක් තරම් සෙවිල්ලකින් සොයාලූ සිත් නැමැති ගෙයක් කෙලෙස් නැමැති එක් තරම් වැස්සක් වටත් තෙමි මුත් නොහැකිවේය."

i. මෙහි සඳහන් ඇපය කුමක් ද?
..............................................................................................................
.............................................................................................................. (ලකුණු 04)

ii. ගිහි වීමට ඇති ආලය අත් ඇරියේ කවුරුන්ද ? එසේ අත් ඇරියේ ඇයි?

.......................................................................................................

....................................................................................................... (ලකුණු 04)

iii. මෙහි සඳහන් සිත් නැමැති ගෙය කෙලෙස් වැස්සෙන් නොතෙමෙන අයුරු දක්වන්න.

.......................................................................................................

....................................................................................................... (ලකුණු 06)

iv. ධර්මසේන හිමියන් භාවිත රචනා ශෛලිය මේ කොටස ඇසුරෙන් පැහැදිලි කරන්න.

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

....................................................................................................... (ලකුණු 06)

නැතහොත්

ගොඩේ කන්දෙ මූකලාන කම්පා කරමින්නේ
රූස්සයෙකි රැ පාළුව බිඳගෙන ඇද වැටුණේ
අඩ නින්දෙම පත් පැදුරට උණු කඳුලක් වැටුණේ
මූකලාන පස් වැටියක් වී හීනෙන් පෙනුණේ

යස දරුවන් ගෙන ඇකයෙන් කැපුවත් නොසැලෙන්නේ
දුක් කරදර කෝටියක් ම ගිලගෙන හිනැහෙන්නේ
සියතින් මර විපත කටින මිනිසුන් දකිමින්නේ
මහා පුරුෂයෙකු වාගේ කන්ද නැගී ඉන්නේ

පිරුණු ලොරිය ගම් දොරකඩ පියමං කර යනවා
පාර වුණත් හිරිහැරයක් නෑ ඔහෙ නිදියනවා
පැලේ වහල ඇද හැලිලා මාසයක්ම වෙනවා
පරාල තුනකට අයියා හිරේ හුං හුං ලනවා

පොරොව කියත කලුවරේම පණ ආවා ලෙසිනේ
මාගෙ ඇඟ උඩ පට්ටල් බැඳ කපනු ඉරනු වැන්නේ
දෙයියන්ගේ මල්ලිලාට දෙයියොම රැවටෙන්නේ
කාන්තාරගම මායිම් තවත් පුළුල් වෙන්නේ

i. මෙම කවි පෙළට වස්තු විෂය වීඇත්තේ කුමක් ද?

.......................................................................................................

....................................................................................................... (ලකුණු 04)

ii. කවිපෙළ තුළින් හඳුනාගත් කාව්‍යෝපක්‍රම දෙකක් නම් කරන්න.

.......................................................................................................

....................................................................................................... (ලකුණු 04)

iii. කවියා යොදාගත් භාෂාව කොතෙක් දුරට ගැළපේ ද?

.......................................................................................................

....................................................................................................... (ලකුණු 06)

iv. "දෙයියන්ගේ මල්ලිලාට දෙයියොම රැවටෙන්නේ" යන පදයෙන් කියවෙන අදහස කුමක් ද?

.......................................................................................................

.......................................................................................................

....................................................................................................... (ලකුණු 06)

(3) WWW.PastPapers.WiKi (2)



Download Term Test Papers, Short Notes From One Place!

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved



11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 47 S I,II

නම: ..........................................

සිංහල සාහිත්‍ය රසාස්වාදය - II

# II පත්‍රය

- පළමුවන ප්‍රශ්නයද 2, 3, 4 5 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකක් ද ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.
- මෙම පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට උත්තර ලියන කඩදාසි භාවිත කරන්න.

**(01) පහත සඳහන් පැදි පෙළ කියවා දී ඇති ප්‍රකාශ උපයෝගී කොට ගෙන වචන 200 කින් පමණ රසාස්වාදයක් ලියන්න.**

පෙරදිග ගොරහැඬි රකුසෝ
මගේ ධ්‍යානය ඇයි කඩන්නේ
නිදාගන්න පොරොවා ගත්ත
කළු රෙදි පොට
මොකටද මේ
තීරුවලට ඉරා දමන්නේ

කුරුල්ලන්ට ගල්ගහලා
උන් හොඳට ම බිය කරලා
මල් පොහොට්ටු තිගැස්සිලා
කඳුළු හෙළනවා

ඇස් දෙක මම අරින්නෙ නෑ
තුරුලු කරන් භාවනාව
නැවතත් යන්නට යනවා
මම
මගේ දූහැන ලෝකයට ම

අ) කවි පන්තියේ වස්තු විෂය
ආ) කවියා යොදාගත් කාව්‍යෝක්ති
ඇ) කවියා යොදාගත් භාෂාව
ඉ) ආකෘතිය
උ) කවි පන්තියේ අපූර්වත්වය (ලකුණු 6×5 = 30)

(02) පුද්ගල මනෝභාවයන් නිරූපණය කිරීමට අවස්ථා හා සිද්ධි ගැළපෙන ලෙස යොදාගත්ආකාරය "වැලපීම" කෙටි කතාවෙන් උදාහරණ තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

(03) විවිධ මිනිස් දුර්වලතා හාස්‍ය හා උපහාසය ධ්වනිත වන අයුරින් ඉදිරිපත්කරන ආකාරය "සුභාෂිතය" පද්‍ය ඇසුරින් උදාහරණ තුනක් දෙමින් විමසන්න. (ලකුණු 15)

(04) රසවිඳින්නා තුළ අපූර්ව චිත්ත රූප මැවීමට කුස ජාතක කතාකරුවා තුළ වූ සමත්කම නිදසුන් තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

(05) "ගැඹුරු දහමක් රසවත් කතාවක් තුළින් ඉස්මතු කිරීමට සද්ධර්මරත්නාවලි කතුහිමියෝ සමත් වෙති." නන්ද තෙරුන් වහන්සේගේ කතා වස්තුව ඇසුරින් උදාහරණ තුනක්වත් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

PAST PAPERS WIKI
(3) WWW.PastPapers.WiKi (3)



Download Term Test Papers, Short Notes From One Place!

සිංහල සාහිත්‍ය හා රසාස්වාදය
11 ශ්‍රේණිය -පිළිතුරු පත්‍රය

## I - පත්‍රය

(01) i. (අ) කොටළුවා (ආ) කප්පට වෙළෙන්දාට
ii. (අ) කඩදාසි කුට්ටම් සෙල්ලම (ආ) තුංමං හන්දිය
iii. (අ) ඉයෝනා පොටපොෆ් (ආ)ඉයෝනා එතැනින් පන්නා ගැනීම
iv. (අ) මාළිගාවේ දොරටුව අසළට රැස්වූ බොහෝ දෙනා (ආ) සක් දෙවිඳු / ශක්‍රයා
v. (අ) උතුරෙන් (ආ) සාගර පලන්සූරිය කවියා

(02) i. දෙවඟනන් පන්සියයක් ලබාදෙන බවට වූ පොරොන්දුව
ii. නන්ද තෙරුන් වහන්සේ
නන්ද තෙරුන් වහන්සේ රහත් ඵලයට පත්වීම නිසා
iii. සිත් නැමති ගෙය කෙලෙස් නැමති වැස්සෙන් නොතෙමෙන්නේ සමථ, භාවනා විදර්ශනා භාවනා නැමති සෙවිල්ල දැමූ විටය.
iv. ගැඹුරු දහම් කරුණු සරල උපමා භාවිත කරමින් පැහැදිලි කර ඇත.
සිත ගෙයකට ද කෙලෙස් වැස්සකට ද භාවනාව සෙවිල්ලකට ද ආදී ලෙස සමාන කර ඇත.

නැතහොත්
i. ගොඩේ කන්ද මූකලාන නම් වනාන්තරය දැව ජාවාරම්කරුවන්ගේ ග්‍රහණයට හසු වී විනාශ වීම.
ii. උපමා භාවිතය - "මහා පුරුෂයෙකු වාගේ කන්ද නැගී ඉන්නේ"
උත්ප්‍රේක්ෂාලංකාරය - " පාර වුණත් හිරිහැරයක් නෑ ඔහෙ තිදියනවා"
චිත්ත රූප මැවීම - " රුස්සයෙකි රෑ පාළුව බිඳගෙන ඇද වැටුණේ"
iii. සරල භාෂාව - "ගොඩේ කන්ද මූකලාන කම්පා කරමින්නේ"
තේමාවට උචිත භාෂාව - "මූකලාන පස්වැටියක් වී හීනෙන් පෙණුනේ"
"මගේ ඇඟ උඩ පට්ටල් බැඳ කපනු ඉරනු වැන්නේ"
ගැමි භාෂාව - "පන් පැදුරට" "පැලේ වහල" "හූං හූං ලනවා"
iv. මුදල ඉදිරියේ ගුණයහපත්කම ද යටවෙන බව

## II - පත්‍රය

(01) අ) • කවි පන්තියේ වස්තු විෂය
• පොදු සුලබ අත්දැකීමක් වූ උදෑසන මූලික කරගෙන තිබීම.
• ගතානුගතික බවින් තොර වීම. මේ තුළින් ව්‍යංග්‍යවත් කරනුයේ හිරු උදාව නූතන මිනිසාගේ ප්‍රමෝදයට නොව චිත්ත අසහනයට හේතු වී ඇති බව.
උදා:- පෙරදිග ගොරහැඬි රකුසෝ - මගේ ධ්‍යානය ඇයි කඩන්නේ
නිදාගන්න පොරොවා ගත්ත - කළු රෙදි පොට මොකට ද මේ
තීරුවලට ඉරා දමන්නේ
• චෛතසික ව්‍යාකුලත්වය හා අසහනය ඉදිරියේ දිනයක උදාවීම සමඟ ඇසෙන ගී නද හා මල් පොහොට්ටුවල ඇති පිනිබිඳු කවියා චිත්‍රණය කරනුයේ,
උදා:- කුරුල්ලන්ට ගල් ගහලා - උන් හොඳටම බය කරලා
මල් පොහොට්ටු තිගැස්සිලා -කඳුළු හෙළනවා
ආ) • කථකයාට ලෝකය දෙස දෙනෙත් හැර බැලිය නොහැකි බව
උදා:- ඇස් දෙක මම අරින්නෙ නෑ - තුරුලු කරන් භාවනාව
• හිරු උදාව නුරුස්සන බව හා කෝපය ඇති වන බව
උදා:- පෙරදිග ගොරහැඬි රකුසෝ - මගෙ ධ්‍යානය ඇයි කඩන්නේ
උදා:- නිදාගන්න පොරොවගත්ත - කලු රෙදි පොට මොකටද මේ
තීරුවලට ඉරා දමන්නේ
ඇ) • ප්‍රබල යටිපෙළ අරුත් ඇති වන ලෙස වදන් ගෙන තිබීම.
පෙරදිග ගොරහැඬි රකුසෝ , තීරුවලට ඉරා දමන්නේ , මල් පොහොට්ටු තිගැස්සිලා වැනි ධ්වනිතාර්ථවත් පද භාවිත කර තිබීම.
• කුරුල්ලන්ට ගල් ගහලා - උන් හොඳට ම බය කරලා මෙම යෙදුම් පරීක්ෂා කර බලන විට කටවහර යොදාගෙන තිබීට.
ඉ) • නිසඳැස් ආකෘතිය යොදාගෙන තිබීම.
ඇස්දෙක මම අරින්නෙ නෑ- තුරුලු කරන් භාවනාව
• භාවයන්ට ආමන්ත්‍රණය කළ හැකිව තිබීම. මෙමඟින් පෙන්වා දිය හැකිය.
උ) • හිරු පායා ඒම නිසා උදාවන දවස සහෘදයාට පීඩාකාරී එකක් බව ගොරහැඬි රකුසෙකුට සංකේතවත් කිරීම තුළින් පෙන්වා දේ.
• අපූර්වත්වය නිරූපණය වන්නේ දෛනිකව සිදුවන ස්වාභාවික සිද්ධි දාමයන් වෙනස් ආකාරයකින් දැකීමයි.
"පෙරදිග ගොරහැඬි රකුසෝ"

(02) • මුළු පරිසරය ම හිමෙන් වැසී ඇති බවත් , හිම කන්දක් කඩා වැටුණත් ඉන් ගැළවීමට ඔහුට වුවමනාවක් නැති බව
උදා:- "ඔහු ඉන්නේ හිම කන්දක් කඩා වැටුණත් ඉන් ගැලවීමට උවමනාවක් නැත්තෙකු මෙනි"
• පහන් එළිය අඩු වීමෙන් ඔහුගේ බලාපොරොත්තුව හීන වන බව
"සැඳෑ මීදුම නගරය වෙත ගලායමින් , බැබළෙමින් පැවති පහන් එළිය සුදුමැලි කරයි"


(2) WWW.PastPapers.WiKi (1)
Download Term Test Papers, Short Notes From One Place!

- තම පුතු මියගිය බව පවසා දුක තුනීකර ගැනීමට ඔහුට අවස්ථාවක් නොලැබීම. සිකිවකු ඔහුට අනුකම්පා නොකිරීම, බැන වැදීම, අවලාද කීම.
  "කොහේද යකෝ යන්නේ? දකුණට උඹ දක්කන්න දන්නෙ නෑ"
  උඹ මැරිල ද බොල නාකියෝ

(03)
- මිනිසා තුළ ඇති කෲරත්වය පිළිබඳව උපහාසයෙන් කතා කිරීම.
  "කුරිරු ගොර සපුන්ගේ දළ ගෙහි විසය.... කවිය
- ප්‍රබලයාගේ බලය ඇති දුබලයා ද අනිසි ලෙස තම මානය එළි දක්වන ආකාරය
  "පරසිඳු පබු දනන් සෙවි පමණින්  මහරු ... කවිය
- මිනිසා තුළ පවතින යහගුණ මෙන් ම දුර්ගුණ ද ඉදිරිපත් කිරීම.
  "මිනිස් හට සොඳුරු ගුණ සහ නුගුණ ඇත ...."

(04)
- ප්‍රභාවතීන් විසින් මඟුල් පොකුණේ දී පියවි රූපයෙන් කුස රජු දුටු අවස්ථාව
  උදා:- "එකල්හ රජ්ජුරුවෝ නෙළුම්පත ඉවත් කොට "මම කුස රජය" යි ප්‍රභාවතීන්ගේ අත ඇල්លූය. ඔහුගේ මුඛය දැක "යක්‍ෂයෙක් මා අත අල්වා ගතැ" යි මුරගාමින් හයින් මූර්ජාව ගියාය"

- ප්‍රභාවතීන් පතා සත් රජුන් යුධයට පිවිසි අවස්ථාවේ පිය රජු විසින් ප්‍රභාවතීන් සත් කඩකට කපා රජුන්ට දීමට තීරණය කළ විට හයින් පීඩිතව මඩ මිශ්‍ර බොර දියේ සිටි කුස රජු ඉදිරියේ වැතිරී සමාව යැදීම.
  උදා:- "එකල ප්‍රභාවතී ගොස් බෝධිසත්වයන්ගේ පත්ලෙහි ඉස තබා මහ පවනින් මුලින් උපුටා එලන ලද ස්වර්ණ කාල ස්කන්ධයක් පරිද්දෙන් මඩෙහි වැතිර ..."

- ප්‍රභාවතිගේ කිරි මව වූ කුදි, සීලවති බිසවගේ චර පුරුෂයන් විසින් තබන ලද රන් රුව දැක ප්‍රභාවතී යැයි රැවටී එහි කොපුල් තලයට පහරක් ගසා ලැජ්ජාවට පත්වන අවස්ථාව
  උදා:- " බලග මා කළ දෙයක. මම් මාගේ දියණියකයැයි සිතා පහරක් ගැසිමි. මෝ තොම මාගේ දරුවන්ගේ රුවට කුමක් අගී ද මාගේ අතට ආයාස වූ පමණකැ" යි.

PAST PAPERS WIKI
(2) WWW.PastPapers.WiKi (2)



Download Term Test Papers, Short Notes From One Place!


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න